# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,477 - 2026 පෙබරවාරි මස 20 සිකුරාදා - 2026.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 62 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 64 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මාර්තු මස 13 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 පෙබරවාරි මස 27 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 ජනවාරි මස 02 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

61 - B 082765 - (2026/02)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් යූ. ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1983.05.30 දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/947 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දෙවලපොල, ගනිහිමුල්ල, පේරලන්දවත්ත පදිංචි හරමානිස් ජයසේකර ලියනආරච්චි වෙත ප්‍රදානය කොට ගම්පහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මිග/මිනු/01/249 යටතේ 1987.11.29 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තියෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.03.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දාසිය පත්තුවේ 106/107 දෙවලපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගනිහිමුල්ල නමැති ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත මු. පි. ගම්. 453 දරන කට්ටි කැබීමේ පිඹුරෙහි අංක 48 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොටඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.101 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ පේරලන්දවත්ත නමැති රජයේ ඉඩම.

*උතුරට* : කට්ටි අංක 47
*නැගෙනහිරට* : ප්‍රවේශ පාර
*දකුණට* : කට්ටි අංක 49
*බස්නාහිරට* : පේරලන්දවත්ත

යූ. ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා,
ප්‍රාදේශීය ලේකම්,
මිනුවන්ගොඩ.

2025 නොවැම්බර් මස 17 වැනි දින.

02-340/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් යූ. ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1987.02.10 දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/9301 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පත්තඩුවන, මිනුවන්ගොඩ පදිංචි විජේරත්න ආරච්චිලාගේ ජයසේන වෙත ප්‍රදානය කොට මීගමුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මිග/මිනු/354 යටතේ1991.03.12 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.03.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දාසිය පත්තුවේ 118, පත්තඩුවන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පත්තඩුවන ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත මු. පි. ගම්. 538 දරන කට්ටි කැබීමේ පිඹුරෙහි අංක 17 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොටඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1084 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ මහහේන නමැති රජයේ ඉඩම.

*උතුරට* : ප්‍රවේශ මාර්ගය
*නැගෙනහිරට* : කට්ටි අංක 11 හා 16
*දකුණට* : ප්‍රවේශ මාර්ගය
*බස්නාහිරට* : ප්‍රවේශ මාර්ගය

යූ. ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා,
ප්‍රාදේශීය ලේකම්,
මිනුවන්ගොඩ.

2025 දෙසැම්බර් මස 19 දින.

02-340/2

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් විස්මන් ආචාරිගේ වීණා දිලේෂ් පර්ල් රසාංජනී වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1982.04.19 දින ප්‍රදානය කර ඇති ගා/ප්‍ර 654 - LL 14281 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තෙල්ලඹුර පදිංචි වලකුඹුර ගමගේ ලැයිසොහාමි වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO D 1/140 යටතේ 1982.07.28 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.03.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ තල්පෙ පත්තුව (උතුර) පත්තුවේ තෙල්ලඹුර (අ. ග. පි. 637) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තෙල්ලඹුර නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 01, පර්චස් 38ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම : ගොලුවමලකන්දහේන (කැබලි අංක 1670),

*උතුරට* : මෙම සැලැස්මේ කැබලි අංක 57, 59 සහ 1064,
*නැගෙනහිරට* : මෙම සැලැස්මේ කැබලි අංක 57 සහ 1064,
*දකුණට* : මෙම සැලැස්මේ කැබලි අංක 1064,
*බස්නාහිරට* : මෙම සැලැස්මේ කැබලි අංක 1064.

වී. ඒ. වී. ඩී. පී. රසාංජනී,
ප්‍රාදේශීය ලේකම්,
යක්කලමුල්ල.

2025 ඔක්තෝබර් මස 27 වැනි දින.

02-342/1

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජී. පී. ඒ. තිළිණි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1995.12.26 දින ප්‍රදානය කර ඇති අංක 2/ගා/13ප්‍ර/33394 හා එල්. එල්. 4225 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පෝද්දිවල පදිංචි කෝරලේගම පතිරගේ ඥාණවතී වෙත ප්‍රදානය කොට බලපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO P8/30 හා LDO B 27/178 යටතේ 1997.02.13 හා 2009.02.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.03.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙන්තර වලල්ලාවිටි කෝරළේ (දකුණ) 34බී පෝද්දිවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පෝද්දිවල (අ. ග. පි. 581) නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 03, පර්චස් 29ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම : තැන්නහේන.

*උතුරට* : පී. එච්. පේදිරික් මයාගේ ඉඩම,
*නැගෙනහිරට* : මධ්‍යම පන්තික කුඹුර,
*දකුණට* : මධ්‍යම පන්තික ඉඩම,
*බස්නාහිරට* : එම්. ජී. ප්‍රැන්සිස් මයාගේ ඉඩම.

ජී. පී. ඒ. තිළිණි,
ප්‍රදේශීය ලේකම්,
නියාගම.

2025 දෙසැම්බර් මස 28 වැනි දින.

02-342/2

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/77514.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* UPLC/L/26/KG/L/277.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මොනරාගල දිස්ත්‍රික්කයේ කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 146A සෙල්ලකතරගම ග්‍රාම නිලධාරි වසමේ, සෙල්ලකතරගම ගමෙහි පිහිටි ජනපද නිලධාරි මහතා විසින් අඳින ලද අංක UVA/MO/KTG/LND/146-A/LTL/COM/506 කැබලි අංක A මගින් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 13.4 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා පල්ලෙවෙලගේ ලෙස්ලි මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ. :

*උතුරට* : පී. ලෙස්ලි භුක්ති විඳින ඉඩම;
*නැගෙනහිරට* : කුමාර භුක්ති විඳින ඉඩම;
*දකුණට* : කේ. ඒ. නිමල් භුක්ති විඳින ඉඩම;
*බටහිරට* : පාර රක්ෂිතය.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.11.25 - 2055.11.24 දක්වා)
*වාර්ෂික බදු මුදල.*- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට හෝ රුපියල් මිලියන පහ (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ,

(ආ) *බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී* ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) *බදු ගන්නන් විසින් මෙකී ඉඩම* වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඉ) *සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.*

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2025.11.25 දින සිට වසර 05ක් ගත වන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 පෙබරවාරි මස 10 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-341

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/79589.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NWP/PLC/L9/KW/LTL/06.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 1178 ඉහල ඇඹව ග්‍රාම නිලධාරි වසමේ

කබලෑව ගමේ අ. ග. පි. 2202 හි කැබලි අංක 111 න් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 02 ක් විශාල වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුත්තක් වන සමූපකාර ප්‍රාදේශීකය සහ ග්‍රාමීය බැංකුව පවත්වාගෙන යාම සඳහා සීමා සහිත කුලියාපිටිය කොට්ඨාසයේ විවිධ සේවා සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ. :

| | |
|---|---|
| *උතුරට* | : අ. ග. පි. 2202 හි 113 රක්ෂිතය සහ 115 (ඇඹව උප තැපැල් කාර්යාලය පිහිටි ඉඩම); |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 2208 ඇඹව ගම් මායිම; |
| *දකුණට* | : අ. ග. පි. 2202 හි 114 වැනි කැබැල්ල (මාර්ග රක්ෂිතය) ; |
| *බටහිරට* | : අ. ග. පි. 2202 හි 113 මාර්ග රක්ෂිතය සහ කැබලෑවට යන මාර්ගය |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.11.21 සිට 2055.11.20 දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල.*- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2025 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- අය නොකෙරේ,

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුලත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.11.21 දින සිට වසර 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොලියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 පෙබරවාරි මස 10 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-343

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/54802.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* SPLC/GAL/3/3/61

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල - කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 96සී, කළුවැල්ල ග්‍රාම නිලධාරි වසමේ කළුවැල්ල ගමේ අනුරේඛණ අංක GA/GFG/09/297 හි කැබලි අංක C මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0469 ක් පමණ වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ. :

*උතුරට* : පෝරකගොඩැල්ල, මූ. පි. ගා. 12435 කැබලි අංක 03 සහ 04;
*නැගෙනහිරට* : ටෙම්ප්ලර්ස් පාර සහ අංක GA/GFG/09/297 දරන අනුරේඛණයේ A කැබැල්ල;
*දකුණට* : කොළඹ පාර සහ අංක GA/GFG/09/297 දරන අනුරේඛණයේ A කැබැල්ල ;
*බටහිරට* : පෝරකගොඩැල්ල වරිපනම් අංක 01 සහ 20

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2023.01.17 - දින සිට 2053.01.16 දක්වා)

*වාර්ෂික බදු මුදල.*- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) හෝ මිලියන පහ (රු. 5,000,000) ට වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- අය නොකෙරේ,

*(ආ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුලත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* සාදා ඇති/ සාදනු ලබන ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.01.17 දින සිට වසර 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොලියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 පෙබරවාරි මස 02 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-352

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/79955.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NWP/PLC/L9/GW/LTL/13

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 433, තිත්තවැල්ල ග්‍රාම නිලධාරි වසමේ තිත්තවැල්ල ගමේ අ. ග. පි. 2773 පිඹුරෙහි කැබලි අංක 438 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.159 ක් විශාල වූ රජයේ ඉඩම් කොටස සමිති කටයුත්තක් වන පොදු පහසුකම් මධ්‍යස්ථානය සහ සමිති කටයුතු පවත්වාගෙන යාම සඳහා තිත්තවැල්ල මැටි භාණ්ඩ කාර්මිකයන්ගේ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනය සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ. :

*උතුරට* : කැබලි අංක 440 සහ 336
*නැගෙනහිරට* : කැබලි අංක 337 සහ 340
*දකුණට* : කැබලි අංක 439
*බටහිරට* : කැබලි අංක 440

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.11.21 දින සිට 2055.11.20 දින දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.

*වාර මුදල* :- අය නොකෙරේ,

*(ඇ)* මෙම ඉඩම පොදු පහසුකම් මධ්‍යස්ථානය සහ සමිති කටයුතු පවත්වාගෙන යාම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.11.21 දින සිට වසර 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොලියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2026 පෙබරවාරි මස 10 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-344